**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ශුද්ධ වත්කම්වල අඩුවීම**
**--------------------------**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,329,326 කින් ශුද්ධ වත්කම් අඩුවී තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**--------------------------**

ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ එකතුව රු.53,990,989 ක් වූ අතර, එම උපයෝගී ලේඛනවල ශේෂ එකතුව රු.53,091,505 ක් වූයෙන් රු.899,484 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>
2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.52,401,645 ක් වූ අතර, එයින් අවුරුදු 03 කට වැඩි කාලයක සිට අයවීමකින් තොරව පවත්නා ශේෂවල එකතුව රු.2,284,950 ක් විය.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>
2016 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.54,526,945 ක් වූ අතර, එයින් වසර 3 කට වැඩි කාලයක් තුල නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.890,810 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

ගිණුම් විෂයයන් 07 කට අදාලව එකතුව රු.819,226 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීම සඳහා අදාලවන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

**1.3.5 නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) | |
| 217 රීතිය | පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර පවත්වාගෙන නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,490,368 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,368,661 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,878,293 ක පහත වැටීම කෙරෙහි පුනරාවර්තන වියදම් වැඩිවීම හා සභාවේ වෙනත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1.05:1 ක් හා 2015 වර්ෂයේ එය 1.51:1 ක් විය. ඒ අනුව, 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ පිරිහීමක් නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

**2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල වරිපනම් අයවීම සියයට 79 ක් වූ අතර, පෙර වර්ෂවල හිඟ අයවීම සියයට 55 ක් වී තිබුණි.

**2.4.2 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.240,313 ක් වූ වරිපනම් බදු අයකර ගැනීමට තිබුණි.

**2.4.3 කුලී**

**-----**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.107,472 ක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්ය සාධන ඇගයීම**

**------------------------**

2016 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

රු.1,338,227 ක් වූ කසල කළමනාකරණ ව්‍යාපෘතිය සහ රු.4,594,050 ක් වූ නිවාඩු නිකේතනයක් වර්ෂ 02 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**----------------------------------**

දෛනිකව නගරයේ කසළ එක්රැස් කර විවෘතව බැහැර කිරීම හේතුවෙන් විවිධ පාරිසරික ගැටළු ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 58 ක්වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 47 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ආ) කාර්ය මණ්ඩලය තුළ සංවර්ධන නිලධාරී, රියදුරු, වැඩ කම්කරු සහ පුස්තකාල සහායක යන තනතුරු සඳහා එක් නිලධාරියෙකු බැගින් බඳවා ගැනීම් සිදුකර තිබුණද, එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**---------------------------------------------**

**4.1 අයවැය පාලනය**

**--------------------**

2016 වර්ෂයේ සභා අරමුදලින් කර්මාන්ත 04 ක් ඉටුකිරීම සඳහා රු.1,700,000ක් වෙන්කර තිබුණ ද, වර්ෂය අවසන් වනවිට ඇස්තමේන්තු කල කර්මාන්ත නොව වෙනත් කර්මාන්ත 05 ක් සඳහා සභා අරමුදලින් රු.1,083,570 ක් වැය කරමින් ක්‍රියාත්මක කර තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------**

2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබුණි.

**පාලන**

-------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | **පද්ධතිය** | **නිරීක්ෂණය** |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ගබඩා පාලනය | තොග ලේඛනය යාවත්කාලීන කිරීම හා තොග පාලනය විධිමත් අයුරින් සිදුකර නොතිබුණි. |
| (ඇ) | කසළ කළමනාකරණය | සභා බලප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ විවෘත ප්‍රදේශවලට බැහැර කිරීම හේතුවෙන් පාරිසරික ගැටළු මතුවීමේ අවදානම කෙරෙහි සැලකිලිමත් වී නොතිබුණි. |